# 1965 ආර්ථික ප්‍රශ්න හා ප්‍රතිපත්ති

## හැඳින්වීම

දළ ජාතික නිෂ්පාදිතයට අනුව මණින විට, 1965 දී ලංකාවේ ආර්ථික කටයුතු සාදනයෙහි අඩුවීමෙක් දක්නට ලැබේ. 1964 දී දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා සාධක මිල අනුව සියයට 5·8 කින් වැඩි විය. එහෙත්, 1965 දී වැඩි වී ඇත්තේ සියයට 4·0 කින් පමණෙකි. මූර්ත වශයෙන්, එනම් (1959) ස්ථාවර මිල අනුව, බලන විට, 1965 වැඩි වී ඇත්තේ සියයට 2·0 කින් පමණෙකි. එහෙත් 1964 දී ඇති වූ මූර්ත වැඩිවීම සියයට 4·4 කි. සියයට 2·4 කින් වැඩිවන ජනගහණය ද ගණන් ගත්විට, පවත්නා මිල අනුව, ඒකජන වශයෙන් දළ ජාතික නිෂ්පාදිතය වැඩි වී ඇත්තේ සියයට 1·7 කින් පමණෙකි. මෙයම මූර්ත වශයෙන් ගෙන බලන විට නියතයෙන් ම සියයට 0·4 කින් අඩු වී ඇත.

1965 අර්ථ ක්‍රමයෙහි ඇති වී තිබෙන මේ බලාපොරොත්තු සුන් කරන සුළු තත්වය බොහෝ සෙයින් ම උද්ගත වී ඇත්තේ, නොවැලැක්විය හැකි සමහර හේතූන් නිසා ය. අහිතකර කාලගුණය නිසා වී නිෂ්පාදනය සියයට 29·5 කින් ද පොල් නිෂ්පාදනය සියයට 10·6 කින් ද විශාල ලෙස අඩු විය. ඇත්තෙන් ම දළ ජාතික නිෂ්පාදිතයේ ඇතිව තිබෙන මඳ වූ ද දියුණුව ඇති වූයේ අර්ථ ක්‍රමයේ අනෙකුත් අංශවල ඇති වූ දියුණුව හේතුකොට ගෙනය.

මෑත අවුරුදුවල ලංකාවේ අර්ථ ක්‍රමයෙහි දක්නට ලැබුන ලක්ෂණයක් වූ පිටරට වලට ගෙවීමේ දී උද්ගතවන මුදල් හිඟය, 1965 අවුරුද්දේ ද පැවතිණි. එසේ වුව ද, අවුරුද්ද අවසාන වනවිට, විදේශීය වත්කම් රුපියල් කෝටි 8·9 කින් වැඩි වී තිබිණ. පසුගිය අවුරුද්දේ දී වෙළෙඳ අනුපාතය සියයට 2·6 කින් පිරිහුන ද 1965 දී එහි සියයට 1·2 ක දියුණුවක් ඇතිවිය. එද පිටරට සංචිත ප්‍රමාණවත්, නොවුන නිසා ආනයන දැඩි ලෙස කපා හැරීමට සිදුවිය. දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් අන්දමට වර්ධනය නොවූ, එසේම බලාපොරොත්තු නොවූ හේතූන් නිසා විශේෂයෙන් ම වී නිෂ්පාදනය බොහෝ සෙයින් අඩු වී ගිය වකවානුවක, මේ තත්ත්වය ඇතිවීම නිසා අත්‍යාවශ්‍ය ආහාර සඳහා වැය කළ යුතු විදේශීය විනිමය ප්‍රමාණය වැඩිකළ යුතුවිය. මේ නිසා අත්‍යාවශ්‍යම ආහාර වර්ග හැර, අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ගෙන්වීම පවා කපා හළ යුතු විය. ප්‍රාග්ධන ආනයන අඩුවිය. අමු ද්‍රව්‍ය ගෙන්වීම තරමක් වැඩි වුව ද, එද ප්‍රමාණවත් පමණට නොවිය.

වෙළෙඳ අනුපාතය තරමක් වාසි අතට හැරුන ද, ආනයන දැඩි ලෙස කපා හැරිය ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මුදල් ලබා ගැනීමට ද සිදුවිය. මේ අනුව, ප්‍රවේසමෙන් ගෙනගිය ආනයන ප්‍රතිපත්තිය සහ විදේශයෙන් ගත් ණය වැඩිවීම හේතු කොට, 1965 දී විදේශීය වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 8·80 කින් වැඩි විය. 1964 දී විදේශීය වත්කම් රුපියල් කෝටි 1·11 කින් අඩුවූ අතර, ඊට පෙරාතු අවුරුදු වල දී, දිගටම අඩුවෙමින් තිබිණ.

රජයේ අය-වැය ලේඛනයේ ප්‍රාසාරණාත්මක බලපෑම බොහෝ සෙයින් අඩුකර ගැනීමෙන් හා පෞද්ගලික අංශයට දෙන ලද ණය අඩුකර ගැනීමෙන් රටතුළ මූල්‍ය ප්‍රාසාරණය එක්තරා මැදහත් ප්‍රමාණයකින් පවත්වාගෙන යන ලදී. 1964/65 අය-වැය ලේඛනයේ ඇති වූ ප්‍රාසාරණාත්මක හිඟය රුපියල් කෝටි 4·0 ක් විය. එහෙත් 1963/64 මුදල් වර්ෂයේදී ඇති වූ එකී හිඟය රුපියල් කෝටි 16·29 කි. පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු වලින් දෙන ලද ණය වැඩි වී ඇත්තේ රුපියල් කෝටි 0·42 කින් පමණෙකි. මුදල් සැපයුම වැඩි වී ඇත්තේ ද, 1964 දී වැඩි වූවාට වඩා අඩුවෙනි. 1964 දී මුදල් සැපයුම රුපියල් කෝටි 11·58 කින් වැඩි වී ඇති අතර, 1965 දී එය වැඩි වී ඇත්තේ රුපියල් කෝටි 9·38 කින් පමණෙකි.

මෙරට භාණ්ඩ නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම හා පිට රටින් භාණ්ඩ ගෙන්වීම අඩුවීමත් සමගම එක්තරා ප්‍රමාණයක මූල්‍ය ප්‍රාසාරණයක් ද ඇති වීමෙන් පැන නැගි භාණ්ඩ හිඟය දේශීය මිල මට්ටම කෙරෙහි නොකඩවාම බල පැවැත්විනි. මූලික අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල, සහනාධාර නිසා අඩු වී තිබුන ද, අර්ධාවශ්‍ය භාණ්ඩ බොහෝවක් ම, හිඟව තිබිණි. සඟවා ගෙන තිබෙන භාණ්ඩ එළියට ගැනීමට සහ මිල පාලනයට, පරිපාලන වශයෙන් ගන්නා ලද දැඩි ක්‍රියා මාර්ගය නිසා බඩු හිඟයෙහි තරමක සහනයක් ඇතිවිය. මේ ක්‍රියාවලින් බඩු තොග අඩු වී ගිය නිසා වර්ෂය අවසාන වන විට, නැවත තොග රැස් කිරීමට සහ පාරිභෝජනයට අවශ්‍ය භාණ්ඩ බොහෝ සෙයින් ගෙන්වීම අත්‍යාවශ්‍ය විය.

සැලකිය යුතු ප්‍රමාණයකට භාණ්ඩ වලින් ආධාර ලබා ගැනීමට 1965 දෙවැනි භාගයේ දී ඇති කරගෙන තිබෙන ගිවිසුම් නිසා වහාම ඇතිව තිබෙන භාණ්ඩ හිඟය තරමක් දුරට මග හැරෙන හැකිය. එහෙත්, පසුගිය අවුරුද්දේ වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි, ආනයන හැකියාව වැඩිකර ගැනීම, ආර්ථික වර්ධනය සීඝ්‍රයෙන් ඇතිකර ගැනීමේ ඉලක්කයට යාම සඳහා ඇති එක්තරා ක්‍රමයක් පමණකි. පසුගිය වසරවල, අර්ථ ක්‍රමයේ ඇති වූ දියුණුව සීඝ්‍රයෙන් වැඩිවන ජනගහනයක ඒකජන ආදායම අවශ්‍ය පමණට වැඩි කිරීමට තරම්, ප්‍රමාණවත් නොවීය. එම නිසා වහාම කළ යුතුව ඉදිරියේ ඇති කාර්යය වනුයේ, වහාම සංවර්ධනය කළයුතු කලාප තෝරා, හැකි පමණ ඉක්මනට අර්ථ ක්‍රමයේ සංවර්ධනය ඇති කැරෙන සුදුසු සැලැස්මක් සාදා ක්‍රියාත්මක කිරීමය. මේ සම්බන්ධයෙන් අර්ථ ක්‍රමයේ සම්පත් මාර්ග සුදුසු පරිදි උපයෝගී කර ගැනීමේ දී සමහර අවහිර බාධක ඇතිවිය හැකිය. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වාර්තාවේ වෙනත් තැනක කරුණු සඳහන් වෙයි.

## (1) 1965 ආර්ථික වර්ධනය

1965 ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා සාධක වියදම් මිල අනුව, සියයට 4·0 කින්, රුපියල් කෝටි 738·84 කට වැඩි වී ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කොට ඇත. 1964 දී සියයට 5·8 කින් වැඩි වී ඇත.

දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය, මූර්ත වශයෙන් එනම්, 1959 ස්ථාවර මිල අනුව බලන කළ වැඩි වී ඇත්තේ සියයට 2·0 කින් පමණෙකි. මෙය මෑත වර්ෂ වල දී දක්නට ලැබෙන ඉතා අඩුම වර්ධනය වෙයි. අපනයන අංශයේ, මූර්ත අපනයන සියයට 2·1 කින් වැඩි වී ඇති බව පෙනේ. එහෙත් අපනයනයට ඇති තොග, අඩු වී ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. ස්ථාවර මිල අනුව, අපනයන අංශයේ නිෂ්පාදනය (ශුද්ධ) 1965 දී සියයට 0·8 කින් අඩු වී ඇත. මෙයට හාත්පසින්ම වෙනස්ව 1964 දී මේ අංශයේ නිමැවුම සියයට 6·4 කින් වැඩි වී ඇත. දේශීය අංශයෙහි වර්ධනය ද 1964 දීට වඩා අඩුවිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ වී නිෂ්පාදනය සියයට 29·5 කින් අඩුවීමය. එහෙත් සත්ත්ව පාලනය, කාර්මික නිෂ්පාදිතය, ගමනා ගමනය, සහ රජයේ සේවාව වැඩිවෙමින් තිබිණ. මෙහි ප්‍රතිඵලය වූයේ මූර්ත නිෂ්පාදිතය (ශුද්ධ) සුළු වශයෙන් සියයට 1·7 කින් වැඩිවීමය. 1964 දී මෙය සියයට 4·1 කින් වැඩිවිය.

තාවකාලික ඇස්තමේන්තු අනුව, ජනගහනය සියයට 2·4 කින් එනම්, 1964 මට්ටමෙන්ම, වැඩිවෙමින් තිබෙන බව පෙනීයයි. මේ අනුව එක් අයෙකුට වැටෙන නිෂ්පාදනය මුදලින් බලන කල සියයට 1·7 කින් වැඩි වී ඇත ද, මූර්ත වශයෙන් බලන කල එය සියයට 0·4 කින් අඩු වී ඇත. වෙනත් වචන වලින් කියන්නේ නම්, 1965 දළ ජාතික නිෂ්පාදිත වර්ධනය මූර්ත වශයෙන් බලන කල, වැඩිවන ජනගහනයේ පමණට ප්‍රමාණවත් වී නැත.

1965 දී, දළ ජාතික වියදම පවත්නා වෙළෙඳ මිල අනුව, සියයට 3·2 කින් වැඩි වී ඇත. පෞද්ගලික පාරිභෝජන වියදම මඳ වශයෙන් සියයට 1·1 කින් වැඩි වී ඇත. මෙයින්, පැවැති භාණ්ඩ හිඟය පිළිබිඹු වෙයි. රජයේ සමාංයතන ඇතුළු පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය ද සියයට 20·3 කින් අඩු වී ඇත. මෙයින් ප්‍රාග්ධන ආනයන අඩුවීම පිළිබිඹු වෙයි. එහෙත් රජයේ පාරිභෝජන වියදම, සියයට 2·4 කින් හා ප්‍රාග්ධන සම්පාදන වියදම සියයට 21·6 කින් වැඩිවීම නිසා පෞද්ගලික අංශයේ ඇති වූ අඩුව පිරිමැසී ගියේය. මෙහි ඵලය වූයේ, දළ ජාතික වියදම, සියයට 3·2 කින් වැඩිවීමය. 1964 දී වැඩි වූ ප්‍රමාණය සියයට 7·2 ක් විය.

## (2) 1965 පිස්කල් හා මූල්‍ය සංවර්ධනය

මුළු ඉල්ලුම හා මුළු සැපැයුම අතර කිට්ටු සම්බන්ධයක් ඇතිකර ලීම සඳහා මූල්‍ය ප්‍රාසාරණය කපා හැරීම අවශ්‍ය බව 1964 වාර්තාවෙන් පෙන්නුම් කර දෙන ලදී. අධික ක්‍රය ශක්තියේ හෙවත් මිලට ගැනීමේ හැකියාවේ පමණට භාණ්ඩ සම්පාදනයක් නොමැතිවීම නිසා ඇතිවන දුෂ්කරතා 1965 දීත් එලෙසම පැවැතිණි. රජයේ අයවැය ලේඛනය නිසා ඇතිවන උද්ධමනාත්මක බලපෑමක්, බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ණය ප්‍රමාණයත් බොහෝ සෙයින් අඩු කිරීමෙන් මූල්‍ය ප්‍රාසාරණය මැඩපවත්වා ගත්ත ද මැඩපැවැත් වූ පමණටවත් භාණ්ඩ සම්පාදනය (දේශීය හා ආනයන) ඇතිකර ගත නොහැකි විය.

මෙ අනුව බලන විට, 1965 දී අර්ථ ක්‍රමයෙහි අසමතුලිත භාවය ඇතිවූයේ ඉල්ලුම් අංශයට වඩා සැපැයුම් අංශයට නැඹුරුවය. පසුගිය වසර කීපය තුළ නොකඩවාම ඇති වූ මූල්‍ය ප්‍රාසාරණයේ සැඟවීගත් බලපෑම නිසාත්, වර්ෂය තුළ මඳ වශයෙන් වුව ඇති වූ මූල්‍ය ප්‍රාසාරණය නිසාත් නියතයෙන්ම දැඩි ඉල්ලුමක් තිබිණ. අර්ථ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය දුබල්වීම නිසාත්, විදේශීය විනිමය හිඟවීම නිසාත් භාණ්ඩ සම්පාදනය අඩුවිය. මේ නිසා දේශීය මිල මට්ටමෙහි එක්තරා වැඩිවීමෙක් ඇතිවිය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව මණින කල, මිල වැඩි වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. 1964 දී 112·2 ක්වූ මෙය 1965 දී 112·5 කට වැඩිවිය. එහෙත් වර්ෂය තුළ දර්ශකය 113 දක්වා ඉහළ ගියේය. කොළඹ කම්කරු පවුල්වල ජීවන වියදම මැණීමට පමණක් සකසා ඇති නිසා මිල වෙනස්වීම මැණීම සඳහා උපයෝගී කරගතහැකි හොඳ දර්ශකයක් නොවේ මෙය. මෙ සඳහා වුවද දර්ශකය ඌනතා වලින් යුතුය. එහෙත් මිල මට්ටමේ වෙනස්වීම දළ වශයෙන් මැණීමට මේ වැඩට ගත හැකිය. මිල එක්තරා ප්‍රමාණයකින් වැඩි වී ඇති බව දර්ශකයෙන් දැක්වෙයි. 1965 දිගටම ඇති වූ භාණ්ඩ හිඟයෙන් හා මිල වැඩිවීමෙන් මෙය සනාථ වෙයි. අවුරුද්දේ අවසාන කොටසේ දී මේ තත්ත්වය, දැරිය නොහැකි පමණට දැඩිවිය. සඟවාගෙන ඇති භාණ්ඩ එළියට ගැනීමට සහ මිල අඩු කිරීමට රජය විසින් දැඩි පරිශ්‍රමයක් දරන ලදී. මේ පරිශ්‍රම සාර්ථක වූයේ වුව ද, ඉල්ලුමේ පමණට සැපැයුම නොමැතිවීම වැනි මූලික ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා මේ ප්‍රමාණවත් නොවිය.

පසුගිය අවුරුදු වලදී සහ 1965 දී ලංකාවේ අර්ථ ක්‍රමය මුහුණ පා ඇති ප්‍රශ්න නිරාකරණය කිරීමට හැකිවන්නේ, නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මනා ලෙස සැකසූ සැලැස්මක් දැඩි පරිශ්‍රමයෙන් ක්‍රියාත්මක කිරීමෙන්ම පමණෙකි. විදේශාධාර, මිල පාලනය සහ අනෙකුත් පරිපාලන ක්‍රියාවලින් කෙටි කාලීන වශයෙන් සැපැයුම වැඩි කිරීමෙන් මිල මැඩපැවැත්වීමක් කළහැකි වුවද, මූලික වශයෙන් මේ ප්‍රශ්නයේ විසඳුම රඳා ඇත්තේ, වැඩිවන ජනගහනයේ ඒකජන ආදායම් තත්ත්වය වැඩි කිරීම සඳහා අර්ථ ක්‍රමයේ ඇති නිෂ්පාදන හැකියාවන්

සංවිධානය කොට දේශීය භාණ්ඩ නිෂ්පාදනය වැඩි කිරීමෙහි ලා ක්‍රියාත්මක කිරීමෙහිය. ආර්ථික කටයුතු හා ක්‍රම සම්පාදනය සඳහා වෙනම අමාත්‍යාංශයක් ඇති කිරීම, සැලැස්මකට අනුව ආර්ථික වර්ධනය ඇති කිරීමේ අවශ්‍යතාවයට මුල් තැන දී ක්‍රියා කිරීමකි.

පහත එන ඡේදවලින්, 1965 මූල්‍ය හා පිස්කල් තත්ත්වයේ ඇති වූ වර්ධනය දැක්වේ.

## (අ) රජයේ අයවැය ලේඛනය

1964/65 අයවැය ලේඛනයෙන්, පසුගිය අයවැය ලේඛනවල ලක්‍ෂණයක්ව මෙතෙක් පැවති උද්ධමනාත්මක හිඟය සහමුලින්ම නැතිකර ලීමට යත්න දරන ලදී. 1959/60 දී රුපියල් කෝටි 25·11 ක්වූ මෙකී උද්ධමනාත්මක හිඟය ක්‍රම ක්‍රමයෙන් අඩුවූයේ 1962/63 වර්ෂයේ දී රුපියල් කෝටි 16·20 තෙක් අඩුවිය. 1963/64 දී මෙය රුපියල් කෝටි 16·29 ක් වීමෙන් බොහෝ සෙයින්ම ඉකුත් වසරේ මට්ටමේම පැවැතිණි. 1964/65 අයවැය ලේඛනයෙන් මේ උද්ධමනාත්මක හිඟය සහමුලින්ම නැතිකර ලීමට බලාපොරොත්තු විය. කෙසේ හෝ, ක්‍රියාවට නැගීමේ දී මේ බලාපොරොත්තුව එලෙසින්ම සඵල වූයේ නැත. එහෙත් උද්ධ-මනාත්මක හිඟය රුපියල් කෝටි 4·0 දක්වා අඩුකරගනු ලැබිය. මෙසේ අඩුකර ගැනීමට ද හැකි වූයේ බලාපොරොත්තු නොවූ සමහර හේතූන් නිසා මිස, අයවැය යෝජනා එලෙසින්ම ක්‍රියාවට නැගීමෙන් නොවේ.

ලැබුන ආදායම බලාපොරොත්තු වූ ප්‍රමාණයට බොහෝ සෙයින්ම සමාන විය. 1964/65 දී ලැබුන ආදායම රුපියල් කෝටි 181·64 ක් විය. ලැබෙතැයි ඇස්තමේන්තු කළ ආදායම රුපියල් කෝටි 182·13 ක් විය. 1963/64 ලැබුන ආදායම වන රුපියල් කෝටි 175·90 හා සසඳනවිට මෙය ආදායම් තත්ත්වයේ දියුණුවකි.

1964/65 වියදම (තාවකාලික ඇස්තමේන්තු අනුව) රුපියල් කෝටි 231·13 ක් විය. මෙය මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 8·14 කින් අඩුය. මෙසේ වියදම අඩුවීමට හේතු වූයේ වර්තන වියදම රුපියල් කෝටි 0·74 කින් හා ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 7·40 කින් අඩුවීමය. වියදම මෙසේ අඩු වූයේ වුවත්, ප්‍රාග්ධන සඳහා කළ වියදම රුපියල් කෝටි 57·36 ක් වූයේ, 1961/62 පැවැති උපරිම මට්ටම වන රුපියල් කෝටි 58·56 ට වඩා අඩු වී ඇත්තේ රුපියල් කෝටි 1·2 කින් පමණෙකි. නියතයෙන්ම, "මූර්ත වත්කම් අත්පත් කර ගැනීම ඉදිකිරීම හා නඩත්තුව" සම්බන්ධයෙන්, අයවැය ලේඛනය ක්‍රියාවට නැගි ඇති අයුරු බලන විට මේ සඳහා රුපියල් කෝටි 54·71 ක් වැය කිරීමෙන්, මෙතෙක් ලබා ඇති ඉහලම මට්ටමට පැමිණ ඇත. මෙය 1961/62 වැය කළ මුදල වන රුපියල් කෝටි 49·94 ට වැඩිවන අතර, 1963/64 කැරුන වියදමට වඩා රුපියල් කෝටි 5·86 කින්ද වැඩිවිය.

වර්තන වියදම්, මුදල් ඇස්තමේන්තුවට වඩා අඩුවුනා පමණක් නොව, 1963/64 වර්තන වියදමටද වඩා රුපියල් කෝටි 1.59කින් අඩු වී ඇත. මෙය, 1954/55 න් පසුව වූ දස අවුරුදු කාලය තුළ වර්තන වියදම් නොකඩවා ම වැඩිවෙමින් පැවත එන හැඩ ගැස්ම වෙනස් කොට ඊපිට හැරවීමෙකි. එහෙත්, 1963/64 සහ 1964/65 අතර වර්තන වියදම් අඩුවීම ගැන වැඩි සැලකිල්ලක් දක්වීම නොමගයන සුළු විය හැකිය. ඉකුත් වසරේ වර්තන වියදම් වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ සීනි වල ලෝක මිල අතිශයින් වැඩිවීම නිසා ආහාර ආධාරයට කැරුන වියදම වැඩිවීමය. 1964/65 දී සීනිවල ලෝක මිල අතිශයින් ම පහළ වැටිනි. 1962/63 දී රුපියල්637 ක්වූ සීනි ටොන් (දිගු) එකක සාමාන්‍ය ගොඩබෑම් මිල 1963/64 දී රුපියල් 1135 දක්වා වැඩිවිය. 1962/63 වසරේ සීනි ටොන් එකක් (දිගු) ගොඩබාන විට මිල වූයේ රු. 601/- ක් පමණෙකි. මේ අනුව සීනි ගෙන්වා විකිණීමෙන් පමණක් ම රජය ලද ලාභය කෝටි 10·0 ක් විය. මෙසේ සීනි වල මිල, අතිශයින් පහල නොවැටෙන්නට, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ රජයේ ව්‍යාපාර සඳහා වියදම වැඩි වී ඇති නිසා වර්තන වියදම් පුරුදු පරිදීම වැඩි වී 1963/64 මට්ටමට ද වැඩිවිය හැකිව තිබිණි.

1964/65 වර්ෂයේ මූළු අයවැය හිඟය රුපියල් කෝටි 52·33 ක් විය. නිදහස් අරමුදල් දායක දීමනා සහ අත්තිකාරම් ගිණුම් ගනුදෙනු සඳහා ගැලපූවිට, ශුද්ධ අයවැය හිඟය රුපියල් කෝටි 44·25 ක් විය. 1963/64 දී මෙය රුපියල් කෝටි 46·17 ක් වූ අතර, 1962/63 දී මෙය රුපියල් කෝටි 39·17 ක් විය. 1964/65 සහ ඊට පෙරාතු අවුරුදු වල හිඟය පියවූ ආකාරය 1-1 සංඛ්‍යා සටහනේ දැක්වෙයි. 1964/65 දී ඇති වූ ශුද්ධ අය-වැය හිඟය, 1963/64 හිඟයට වඩා රුපියල් කෝටි 1·78 කින් අඩු වූ අතර, හිඟය පියවූ ආකාරයෙහි ද සැලකියයුතු වෙනස්කම් විය. බැංකු ක්‍රමයෙන් හා අනෙකුත් උද්ධමනාත්මක මාර්ග වලින් මුදල් ලබා ගැනීම බොහෝ සෙයින් අඩු කරන ලදී. උද්ධමනාත්මක හිඟය රුපියල් කෝටි 4·0 ක් වූයේ එය මෑත වර්ෂ වලදී දක්නට ලැබුන අඩුම සංඛ්‍යාව විය. අයවැය ලේඛනයෙහි ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම 1958/59 දී මුදුන් මට්ටමෙහි සිට ක්‍රමයෙන් හීනවී ගිය අයුරු මීට ඉහත වාර්තාවල දක්වා ඇත. ශුද්ධ අයවැය හිඟය අතිශයින් ම අඩු වී ගියද, 1963/64 දී ප්‍රාසාරණාත්මක බලපෑම 1962/63 මට්ටමෙහි පැවැතිණි 1964/65 මේ සම්බන්ධයෙන් ඇති වූ හැඩ ගැස්ම පැහැදිලිව ම අත් මඟක් ගෙන ඇති නිසා සවිස්තරව පරීක්ෂා කිරීම වටනේ ය.

සංඛ්‍යා සටහන 1-1

**හිඟය පියවීම, 1960/61 සිට 1964/65 දක්වා**

රුපියල් දශ ලක්ෂ

| පියවූ මාර්ග | 1960/61 | 1961/62 | 1962/63 | 1963/64 | 1964/65 |
|---|---|---|---|---|---|
| 1. බැංකු නොවන මාර්ගයන්ගෙන් හිඟය පියවීම (එකතුව) .. .. .. | 212·2 | 269·7 | 213·2 | 301·1 | 400·0 |
| මෙයින් | | | | | |
| (අ) පරිපාලන ණය .. .. | 29·4 | 104·5 | – 33·8 | – 1·9 | 56·7 |
| (ආ) බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් ගත් ණය .. .. | 165·2 | 109·4 | 153·5 | 207·6 | 243·2 |
| (ඇ) විදේශීය ණය හා දීමනා .. .. | 26·6 | 55·8 | 93·5 | 95·4 | 100·1 |
| 2. බැංකු ක්‍රමයෙන් ගත් දේශීය ණය .. .. | 241·4 | 226·6 | 178·1 | 115·2 | 17·7 |
| 3. යොදගත් රජයේ මුදල් ශේෂ .. .. | නැත | – 40·2 | 0·4 | 45·4 | 24·8 |
| 4. මූළු මුදල් හිඟය (ශුද්ධ) .. .. | 462·5 | 456·1 | 391·7 | 461·7 | 442·5 |
| 5. එ. ජ. ආධාර, ප්‍රතිපාර්ශ්වීය ගිණුමේ වෙනස ගැලපීම .. .. .. | – 7·5 | 4·0 | – 16·5 | 2·3 | – 2·5 |
| 6. අය වැය ලේඛනයේ ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම (2+3+5) .. .. | 233·9 | 190·4 | 162·0 | 162·9 | 40·0 |

රජයේ මූල්‍ය කටයුතු වල, ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් කෝටි 4·0 සීමාවේ තබා ගැනීමට රජයට හැකි වූයේ සාධක කීපයක් නිසා ය. ඉහත පැහැදිලි කළ පරිදි වියදම් අඩුවීමත් ආදායම වැඩිවීමත් නිසා 1964/65 ශුද්ධ අය-වැය හිඟය බලාපොරොත්තු වූවාට වඩා අඩු විය. එහෙත් එය 1963/64 ප්‍රමාණයට වඩා සැලකියයුතු ලෙස අඩු වූයේ නොවේ. හිඟය පියවීමට ද බැංකු නොවන මාර්ග වලින් පසුගිය අවුරුද්දේදීට වඩා රුපියල් කෝටි 9·89 ක් ලබා ගැනීමට රජයට හැකිවිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ පරිපාලන ණය හා දේශීය අංශයේ බැංකු නොවන මාර්ග වලින් වැඩි වැඩියෙන් ණය ලබා ගැනීමය. පසුව කී මාර්ගයෙන් ලැබෙන ප්‍රමාණය 1961/62 සිට ම වැඩි වෙමින් පවතී. ප්‍රධාන වශයෙන් ම රක්ෂණ සංස්ථාව, සේවක අර්ථසාධක අරමුදල, ඉතිරි කිරීමේ ආයතන හා අනෙකුත් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් වලින් ලැබුන ප්‍රමාණය වැඩි වී ඇත.

1964/65 අය-වැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී මුළු අය-වැය හිඟයෙන් රුපියල් කෝටි 22·5 ක් විදේශාධාර වලින් පියවා ගැනීමට බලාපොරොත්තු විය. එහෙත් විදේශාධාර වශයෙන් ලැබුනේ රුපියල් කෝටි 10·01 පමණෙකි. මෙය බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා බොහෝ අඩු වූයේ පසුගිය මුදල් වර්ෂ දෙකේ දී ලද ප්‍රමාණයට වඩා වැඩි වෙනසක් නොවීය. ලැබුන විදේශාධාර ප්‍රමාණය ඇස්තමේන්තු කළ ප්‍රමාණයට, යන්තමින් හෝ කිට්ටු වූයේ නම් අය-වැය ලේඛනයෙන් මද වශයෙන් හෝ ඇති වූ ප්‍රාසාරණාත්මක බලපෑම අඩු කර ගැනීමට තිබිණි.

1965/66 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අය-වැය ලේඛනයෙන් රුපියල් කෝටි 55·86 ක අය-වැය හිඟයක් බලාපොරොත්තු විය. මෙයින් රුපියල් කෝටි 27·5 ක් බැංකු නොවන දේශීය ණය ගැනීම් වලින් ද, රුපියල් කෝටි 17·5ක් විදේශාධාර වලින් ද රුපියල් කෝටි 2·5 ක් පරිපාලන ණය ගැනීම් වලින් ද ගෙන පියවීමට බලාපොරොත්තු වූ අතර, ඉතිරි වූ රුපියල් කෝටි 8·36 ක හිඟය අය-වැය ලේඛනයේ ප්‍රාසාරණාත්මක කොටස වශයෙන් ගණන් ගැණිනි. 1965/66 අය-වැය ලේඛනයෙන්, ඉතිරි කිරීම් සඳහා දී තිබෙන බදු සහනවල හැටියට බැංකු නොවන දේශීය අංශයෙන් වැඩි ණය ප්‍රමාණයක් ලබා ගැනීමට හැකිවන බවට ලකුණු පෙනෙන්නට තිබේ. එසේම බදු සහනයෙන් ලැබුන ආදායම බලාපොරොත්තු වූවාට වඩා වැඩි වීඇත. පරිපාලන ණය ගැනීම් ද වැඩි විය හැකිය. එසේ ම බලාපොරොත්තු වූ පරිදි විදේශාධාර ලැබුනහොත්, ප්‍රාසාරණාත්මක බලපෑම අය-වැය ලේඛනයෙන් බලාපොරොත්තු වූ පරිදි රුපියල් කෝටි 8·0 හි හෝ ඒ ආසන්නයේ තබාගැනීමට පිළිවන් වනු ඇත.

මෙහි දී සඳහන් කළයුතු තවත් කරුණක් නම්, 1965/66 ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් කෝටි 8·0 හෝ ඒ ආසන්නයේ තබා ගැනීමට තැත්කිරීමේ දී ප්‍රාග්ධන වැය ශීර්ෂයේ ඇතිවන ඌන වියදම බොහෝ සෙයින් අඩු කිරීමට හෝ සම්පූර්ණයෙන් තුනී කිරීමට, උත්සාහ දැරීම අත්‍යාවශ්‍ය බවය. 1965/66 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති වර්තන වියදම 1964/65 වර්තන වියදමට වඩා සුළු වශයෙන් වැඩි ය. එම නිසා වර්තන වියදම ද ඇස්තමේන්තු කොට ඇති ප්‍රමාණයට හෝ අඩුවෙන් හෝ තබා ගැනීම අවශ්‍ය වන්නේ ය. මේ අභිප්‍රායයන්හි එලෙස ම පිහිටියහොත්, ප්‍රාග්ධන වියදම වැඩි කර ගනිමින් 1965/66 අය-වැය ලේඛනයේ ප්‍රාසාරණාත්මක බලපෑම අවශ්‍ය මට්ටමේ තබා ගැනීමට හැකි වන්නේ ය.

(ආ) පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය

1965 දී වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය ප්‍රමාණය රුපියල් කෝටි 0·42 කින් වැඩි වී ඇත.[1] මෙය පසුගිය අවුරුදු තුනෙහි දක්නට ලැබුන අත්දැකීම් වලට ඉදුරා වෙනස් විය. එකල මූල්‍ය ප්‍රාසාරණයෙහි ලා ප්‍රධාන හේතුව වූයේ පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය වැඩි වීමය. දළ ජාතික නිෂ්පාදිත සංඛ්‍යා වලින් හෙළි වන පරිදි, අර්ථ ක්‍රමයේ වර්ධනය, ප්‍රමාණවත් වී නොමැත. ආනයන, විශේෂයෙන් ම පෞද්ගලික අංශයේ ආනයන දැඩි ලෙස කපා හැරිණ. රජයේ සමායතන ඇතුළු, පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සැලකිය යුතු ලෙස පහළ වැටිණි. නිමැවුමේ වැඩිවීම ද පසුගිය අවුරුදු වලදීට වඩා අඩු විය. මෙහි ප්‍රතිඵල වශයෙන් අවුරුද්ද තුළ පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය ප්‍රාසාරණය වූයේ මඳ වශයෙනි.

1. රජයේ සමායතන ඇතුළත්වන පරිදි අර්ථ නිරූපනය කර ඇත.

1-2 සංඛ්‍යා සටහනේ පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු වලින් දී ඇති අත්තිකාරම් සම්පිණ්ඩය කොට දක්වා ඇත. 1965 දී ලෝන හා අයිරාවන් වැඩි වී ඇත්තේ රුපියල් කෝටි 1·3 කින් පමණෙකි. එහෙත්, 1964 දී මෙය රුපියල් කෝටි 10·68 කින් වැඩි විය. සුළු වශයෙන් ඇති වූ මේ වැඩිවීම ද රජයේ සමායතන (රුපියල් කෝටි 0·78) හා සමුපකාර ආයතන (රුපියල් කෝටි 0·56) විසින් ලබා ගන්නාලද්දේ විය. පෞද්ගලික අංශයේ අනෙක් කොටස් වලට දෙන ලද ලෝන සහ අයිරා 1964 දී දෙන ලද ප්‍රමාණයේ ම වාගේ පැවතිණි.

සංඛ්‍යා සටහන I-2

## පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු අත්තිකාරම්

රුපියල් දශ ලක්ෂ

| | දෙසැම්බර් අවසානය | | | 1964/65 වෙනස |
|---|---|---|---|---|
| | 1963 | 1964 | 1965 | |
| (අ) එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂ | 82·1 | 74·5 | 71·1 | — 3·4 |
| (ආ) දේශීය බිල් .. | — | ... | ... | ... |
| (ඇ) ආනයන බිල් .. | 65·8 | 48·6† | 49·7 | + 1·1 |
| (ඈ) අපනයන බිල් .. | 72·8 | 53·6 | 47·1 | — 6·5 |
| (ඉ) අයිරාවන් .. | 331·9 | 372·3 | 383·0 | +10·7 |
| (ඊ) ලෝන .. | 213·0 | 279·4 | 281·7 | + 2·3 |
| එකතුව .. | 765·6 | 828·5 | 832·7 | + 4·2 |

(1) 1964 වාර්ෂික වාර්තාවේ, මේ ශීර්ෂ සම්බන්ධයෙන් දී ඇති සංඛ්‍යා සංශෝධනය කොට ඇත.

1963 සහ 1964 මූල්‍ය තත්ත්වයේ දක්නට ලැබුන ප්‍රධාන ලක්ෂණයක් වූ පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය ප්‍රාසාරණය වීම, 1965 දීත් පැවතියේ පෙබරවාරි මාසයේ දී උපරිම අවස්ථාවට නැංගේය. මෙය මාර්තු මාසයේ දී අඩු වී අප්‍රේල්-මැයි වලදී නැවත වැඩි විය. 1965 මැයි මාසයේ දී මහ බැංකුව, ණය ප්‍රාසාරණය සීමා කිරීම සඳහා පියවර ගත්තේ, බැංකු පොළී අනුපාතිකය, සියයට 4 සිට 5 දක්වා වැඩි කරන ලදී. එසේ ම මෙයට පරිපූරික වශයෙන් වෙළෙඳ බැංකු වලින් දිය හැකි ණය සඳහා උපරිම සීමාවක් පනවන ලදී. ප්‍රථම වරට මහජන බැංකුවට[1] සියයට 28 ක සංචිතයක් තැබීමේ අවශ්‍යතාවය පනවන ලදී. මේ ප්‍රතිපත්ති මාර්ගයෙන් පනවන ලද සීමාවක් තුළ ණය පිළිවෙත පාරිභෝජනයෙන් ඈත් කොට නිෂ්පාදනයට නැඹුරු වන සේ සැකැස්මට ප්‍රයත්නයක් දරා ඇත. එහෙත්, තැන්පතු හා අත්තිකාරම් පිළිබඳව, මහ බැංකුවෙන් කැරුන සමීක්ෂණයකට අනුව, තවමත් පාරිභෝජනය සඳහා ණය ප්‍රාසාරණයක් තිබෙන බව හෙළි වේ. කෙසේ වුවද, බැංකු ණය දෙන පිළිවෙළ අත්‍යාවශ්‍ය නිෂ්පාදන හා වණිජ කටයුතු අවශ්‍යතා සඳහා හැඩ ගැස්වීමට ප්‍රයත්නයක් දරනු ලැබේ.

1. 1961 පෙබරවාරි 1 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ පැවැති ඉල්ලුම් තැන්පතු වලට වැඩියෙන් වන ඉල්ලුම් තැන්පතු වලින් සියයට 38 ක විශේෂ සංචිතයක් තබන ලෙස සියළුම වෙළෙඳ බැංකු වලට 1961 පෙබරවාරි 10 වැනි දින සිට නියම කරන ලදී. 1961 ජුලි 2 ද ව්‍යාපාරික කටයුතු ඇරඹූ මහජන බැංකුවට 1965 ජුනි 18 වැනිද තෙක් මේ අවශ්‍යතාවය නොපැන වූයේ, මුල් අවස්ථා වලදී එය පැනවීම නුසුදුසු යැයි සලකන ලද නිසාය.

### (ඇ) මුදල් සැපැයුම

මුදල් සැපැයුම 1965 දී රුපියල් කෝටි 9·38 කින් රුපියල් කෝටි 171·57 දක්වා වැඩි විය. 1965 දී ඇති වූ වැඩිවීම 1964 දී රුපියල් කෝටි 11·58 ක්වූ වැඩිවීමට වඩා අඩුය. 1965 දී මුදල් සැපැයුම වැඩි කිරීමෙහිලා බලපැවැත් වූ සාධක, 1-3 වැනි සංඛ්‍යා සටහනෙන් දැක්වෙයි.

## සංඛ්‍යා සටහන I-3

### මුදල් සැපයුමෙහි වෙනස්වීම (1964 සිට 1965 කාලච්ඡේදයේ අවසානය)

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| **ප්‍රාසාරණාත්මක සාධක** | |
| (අ) බැංකු ක්‍රමයෙන් රජය ගත් ණය .. .. .. | 81·6 |
| (ආ) වෙළෙඳ බැකුවලින් පෞද්ගලික අංශයට දුන් ණය .. .. | 11·0 (1) |
| (ඇ) බැංකු විදේශීය වත්කම් වල (ශුද්ධ) වැඩිවීම .. .. | 79·7 (2) |
| (ඈ) ගැලපිලි .. .. .. .. | 3·2 |
| එකතුව .. .. .. | 175·5 |
| **සංකෝචනාත්මක සාධක** | |
| (අ) කාලීන හා ඉතිරි කිරිම් තැන්පත් වැඩිවීම .. .. | 46·9 |
| (ආ) රජයේ මුදල් ශේෂ .. .. .. | 10·0 |
| (ඇ) වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම .. | 20·2 |
| (ඈ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) වැඩිවීම .. | 4·5 |
| එකතුව .. .. .. | 81·6 |
| මුදල් සැපැයුමෙහි වැඩිවීම .. | 93·8 |

1. බැංකු විදේශීය වත්කම් යටතේ ඇතුළත් වූ අපනයන බිල් ඇතුළත් නොවේ. අපනයන බිල් (1965 දී පහළ වැටුනු) ඇතුළත් කළහොත් පෞද්ගලික අංශයට දෙන ලද දළ බැංකු ණය වැඩි වනුයේ රුපියල් කෝටි 0·42 කින් පමණි.
2. 1965 මැයි මාසයේ දී මහ බැංකුව විසින් රජයේ ආයතන වෙතින් මිලට ගත් රුපියල් කෝටි 3·01 ක ප්‍රකාශිත වටිනාකමක් ඇති විදේශීය වත්කම් ඇතුළත් වේ.

1965 මුදල් සැපැයුම වැඩිවීමට තුඩු දුන් හේතුන් පසුගිය වසරේදීට වඩා වෙනස් මඟක් ගත්තේ ය. තත් වර්ෂයේ මුදල් සැපැයුම වැඩි කිරීමෙහිලා බල පැවැත් වූ ප්‍රධාන සාධකයන් වූයේ බැංකු ක්‍රමයෙන් රජය ණය ගැනීමත්, වෙළෙඳ බැංකුවලින් පෞද්ගලික අංශයට දෙන ලද ණය වැඩිවීමත් ය. බැංකු විදේශීය වත්කම් වල වෙනස් වීමෙන් ඇති වූ බලපෑම ඉතා සුළු විය. 1965 මූල්‍ය ප්‍රාසාරණයෙහිලා ප්‍රධාන බලපෑම ඇති වූයේ බැංකු ක්‍රමයෙන් රජය ණය ගැනීම හේතු කොටගෙනය. වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ලද ණය වලින් ඇති වූ බලපෑම ඉතා සුළු වූ අතර, බැංකු විදේශීය වත්කම් වැඩිවීම මෙහිලා බල-පැවැත් වූ ප්‍රධාන සාධකයක් විය.

කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු 1965 දී ද වැඩි වෙමින් තිබිණි. එහෙත් මේ වැඩිවීම රුපියල් කෝටි 4·69 ක් වූයේ 1964 දී ඇති වූ වැඩිවීම වන රුපියල් කෝටි 6·25 වඩා අඩු විය. මේ දෙවසරෙහි ම ඇති වූ වැඩිවීම 1963 ඇති වූ වැඩිවීම වන රුපියල් කෝටි 6·34 ට වඩා අඩු විය. කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල වූ මේ වර්ධනය මූල්‍ය ප්‍රාසාරණ බලපෑම සමහන් කිරීමෙහිලා ප්‍රධාන සාධකයක් විය.

### (3) 1965 විදේශීය ගෙවීම්

1965 විදේශීය ගෙවීම් තත්ත්වය පිළිබඳ සවිස්තර සැසැඳිල්ලක් වාර්තාවේ II වැනි කොටසෙහි දක්වා ඇත. මේ කොටසින් 1965 ගෙවුම් ශේෂය පිළිබඳ ප්‍රධාන ලක්ෂණ ලුහුඩින් සඳහන් කැරේ.

1964 වාර්ෂික වාර්තාවෙන් ආනයන හැකියාවේ ප්‍රශ්න පිළිබඳව අවධාරණයෙන් සඳහන් කරන ලදි. 1965 වර්ෂය ඇරඹෙන විට ලංකාවේ විදේශීය වත්කම් (රන් පවුම් ණය නිදන් අරමුදල් හැර) රුපියල් කෝටි 30·47 ක ඉතා අඩු මට්ටමක පැවැතිණි. මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ තුබුනේ රුපියල් කෝටි 13·59 ක් පමණෙකි. නිෂ්කාශන ගිණුම්ශේෂද, ඇතුළුව, මෙහි නියම ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 6·76 ක් පමණක් විය. 19 5 ප්‍රථම කාර්තුවේ දී මේ තත්ත්වය තවත් නරක අතට හැරිනි. කෙටි කාලීන වශයෙන් රුපියල් කෝටි 5·12 ක විදේශීය ණයක් ගත්තේ වුවද, 1965 ප්‍රථම කාර්තුවේ දී විදේශීය වත්කම් තවත් රුපියල් කෝටි 0·97 කින් පහළ වැටිණි. ප්‍රථම කාර්තුවේ දී ඇති වූ මේ අඩුව දෙවැනි කාර්තුවේ අවසාන කොටසේ දී පිරිමසා ගත් අතර, කෙටි කාලීන වගකීම් ද අඩුකරගන්නා ලදී. 1965 දෙවැනි කාර්තුවේ දී මෙසේ තත්ත්වය දියුණු කර ගැනීමට හැකි වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් රුපියල් කෝටි 3·82 ක් වටිනා විදේශීය විනිමය මිලයට ගැනීමෙන් හා ආනයන සීමා කිරීමෙන් ඒ සඳහා ගෙවන ප්‍රමාණය අඩුකර ගැනීමෙනුත්ය.

1965 ජුනි අවසාන වන විට, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 16·32 ක්ව පැවැතිණි. මෙය 1964 දෙසැම්බර් අවසාන වන විට පැවැති ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 2·73 කින් වැඩිය. එසේ වුවද, මෙකී ජුනි අවසාන සංඛ්‍යා වලට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගනු ලැබූ රුපියල් කෝටි 3·82 ක් හා රජයේ ආයතන වලින් මහ බැංකුව ලබාගත් රුපියල් කෝටි 3·01 ක ප්‍රකාශිත වටිනාකමින් යුතු විදේශීය වත්කම් ද ඇතුළත් වෙයි. මහ බැංකුවට මෙසේ අසාමාන්‍ය ලෙස විදේශීය විනිමය නොලැබෙන්නට, 1965 ජුනි වන විට මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 10·0 ටත් වඩා අඩු විය හැකිව තිබිණි. මෙසේ අසාමාන්‍ය අන්දමට විදේශීය විනිමය එකතු වී තිබුනද, නිෂ්කාශන ගිණුමේ ශේෂය ද ඇතුළුව 1965 ජුනි අවසානයට මහ බැංකු ජාත්‍යන්තර සංචිතයේ පැවැති ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 6·57 ක් පමණක් විය. මෙය 1964 අවසානයට පැවැති තත්ත්වයට වැඩි වෙනසක් නොවිය.

ආනයන දැඩි ලෙස කපා හැරියද, 1965 ප්‍රථම භාගයේ දී ලංකාවේ ගෙවුම් ශේෂ තත්ත්වය බැරෑරුම් විය. මෙම තත්ත්වයට මුහුණ දීමක් වශයෙන් ප්‍රථම කොට, අවුරුද්දේ දෙවැනි භාගය සඳහා ආනයනය කොටස් වෙන් කිරීම අත් හිටුවන ලදී. විදේශීය වෙළෙඳ බැංකු සමහරකින් කෙටි කාලීන වශයෙන් ණය ගැනීමට කටයුතු සලසන ලදී. දෙවැනිව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමග සාකච්ඡා කොට රුපියල් කෝටි 14·28 ක් වටිනා විදේශීය විනිමය කොටස් වශයෙන් ලබා ගැනීම සඳහා සම්පසාර ගිවිසුමකට එළඹෙන ලදී. තෙවැනිව, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණය හා සංවර්ධන බැංකුවේ සහාය ද ඇතිව, රටෙහි හිගව පැවැති නොයෙක් මාදිලියේ භාණ්ඩ හා විදේශීය විනිමය රැස්කර ගැනීම සඳහා රටවල් කිහිපයකින් ම ඩොලර් කෝටි 5·0 ක ආධාර ලබා ගැනීමට ලංකාවට හැකි විය. ලංකාව මේ රටවල් සමග වහා ම ද්විපාර්ශ්වීය ගිවිසුම් සඳහා සාකච්ඡා ඇරඹූ අතර, අවුරුද්ද අවසාන වන විට, සමහර සාකච්ඡා නිමාවට පත්විය. අනෙක්වා සම්බන්ධයෙන් විස්තර සපයා ගෙන යනු ලැබිණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් සම්පසාර ගිවිසුම, 1965 ජුනි 15 වැනි දින සිට වර්ෂයක් සඳහා වෙයි. මේ ගිවිසුමේ විධිවිධාන යටතේ, ඩොලර් කෝටි 3·0 ක කට සමාන, අනෙක් රටවල මුදල් ලංකාවේ රුපියල් දී කොටස් වශයෙන් අරමුදලෙන් ගැනීමටත් අවසරය ලැබුණේය. මෙසේ මිලයට ගනු ලබන ප්‍රමාණය මුල් මාස හය තුළ ඩොලර් කෝටි 1·5 ක් නොඉක්මවීමටත්, මුල් මාස 9 තුළ ගනු ලබන ප්‍රමාණය ඩොලර් කෝටි 2·25 නොඉක්මවීමටත් නියමිතය. මේ ගිවිසුමට අනුව, මුල් වාරිකය වශයෙන් 1965 ජූලි මාසයේ දී (රුපියල් කෝටි 7·13 කට සමාන) විදේශීය විනිමය ඩොලර් කෝටි 1 5 ක් මිලයට ගනු ලැබීය. මේ සමගම, මහ බැංකුව විසින් විදේශීය ශේෂ හා මෙරට නිපැයුම වැඩි කරමින් රටේ ආර්ථික තත්ත්වය ස්ථාවර කිරීමේ අරමුණෙන් ඉහත කොටසේ විස්තර කොට ඇති පරිදි මූල්‍ය පියවර කීපයක් ගන්නා ලදී.

ආනයන බලපත්‍ර පමා කිරීමෙන් ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් රුපියල් කෝටි 7·13 ක් මිලයට ගැනීමෙන් ද, 1965 තෙවැනි කාර්තුවේදී විදේශීය වත්කම් (දළ) රුපියල් කෝටි 16·49 කින් වැඩිකර ගැනීමට හැකි විය. 1965 සැප්තැම්බර් අවසාන වනවිට, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය ද රුපියල් කෝටි 30·48 තෙක් වැඩි විය. විදේශාධාර ලැබීමේ බලාපොරොත්තුවෙන් හා විවිධ ප්‍රතිකාරක පියවර හේතු කොටගෙන ගෙවුම් ශේෂ තත්ත්වය හොඳ අතට හැරීම නිසා 1965 තෙවැනි කාර්තුවේ දී ආනයන බලපත්‍ර නිකුත් කිරීම නැවතත් ඇරඹිනි. සිව්වැනි කාර්තුවේ දී විදේශීය වත්කම් නැවත පහළ වැටෙන්නට විය. මෙයට හේතු වූයේ රුපියල් කෝටි 2·46 ක් වන රන් පවුන් ණයක් ගෙවීමත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට දී තුබුන රුපියල් කෝටි 1·79 නැවත මිල දී ගැනීමත්, සහ ආනයන බලපත් නැවත දීම නිසා ආනයන සඳහා වැඩියෙන් ගෙවීමට සිදුවීමත් ය.

1965 ගෙවුම් ශේෂ තත්ත්වය පසුගිය වර්ෂවල සංඛ්‍යා සමග සසඳ 1–4 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මේ සංඛ්‍යා තොරතුරු වලින් හෙළි වන පරිදි, මෑත වර්ෂ වල දී ප්‍රථම වරට, 1965 දී ලංකාවට ජංගම ගිණුම් අතිරික්තයක් ලැබී ඇති බව පෙනේ. වෙළෙඳ භාණ්ඩ ගිණුමේ රුපියල් කෝටි 0·5 ක සුළු හිඟයක් ඇති වූවද, ජංගම ගිණුමේ අදිසි වලින් රුපියල් කෝටි 4·70 ක අතිරික්තයක් ඇතිවීම නිසා එකී අඩුව බොහෝ සෙයින් ම මැකී ගියේය. ජංගම ගිණුමේ ඇති වූ මේ අතිරික්තයත්, විදේශීය වගකීම් රුපියල් කෝටි 5·0 කින් වැඩි කර ගැනීමත් නිසා විදේශීය වත්කම් රුපියල් කෝටි 8·90 කින් වැඩි කර ගැනීමටත්, පෞද්ගලික ප්‍රාග්ධන වශයෙන් පිටට ඇදී ගිය රුපියල් කෝටි 1·70 ක් පියවා ගැනීමටත් හැකි විය.

### සංඛ්‍යා සටහන I–4

### 1960 / 1965 ලංකාවේ ගෙවුම් ශේෂය

රුපියල් දශ ලක්ෂ

| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 තාවකාලිකයි |
|---|---|---|---|---|---|---|
| 1. වෙළෙඳ භාණ්ඩ | | | | | | |
| අපනයන නැ. වි. ස. .. | +1,796 | +1,707 | +1,763 | +1,708 | +1,767 | +1,911 |
| ආනයන වි. ර. ගැ. .. | —2,006 | —1,794 | —1,906 | —1,869 | —1,960 | —1,916 |
| වෙළෙඳ ශේෂය .. | — 210 | — 87 | — 143 | — 161 | — 193 | — 5 |
| 2. සේවා .. | — 32 | — 18 | — 4 | — 20 | — 7 | + 16 |
| 3. පරිත්‍යාග .. | + 22 | + 11 | + 7 | + 13 | + 40 | + 36 |
| 4. ජංගම ගිණුම් ශේෂය .. | — 220 | — 94 | — 140 | — 168 | — 160 | + 47 |
| **මුදල් ලබාගත් ක්‍රමය** | | | | | | |
| 5. පෞද්ගලික ප්‍රාග්ධනය | | | | | | |
| දිගු කාලීන .. | + 2 | — 8 | — 2 | + 5 | + 1 | — 3 |
| කෙටි කාලීන (1) .. | — 7 | + 14 | — | — 4 | — 9 | — 14 |
| 6. රජයේ හා බැංකු ප්‍රාග්ධනය | | | | | | |
| (i) දිගු කාලීන විදේශීය වගකීම් වල (ශුද්ධ) වෙනස්වීම් .. | + 20 | + 19 | + 40 | + 75 | + 7 | + 36 |
| (ii) කෙටිකාලීන විදේශීය වගකීම් වල (ශුද්ධ) වෙනස්වීම .. | — 17 | + 81 | + 44 | + 46 | + 59 | + 14 |
| (iii) විදේශීය වත්කම්වල වෙනස්වීම .. | + 193 | + 10 | + 28 | + 42 | + 111 | — 89 |
| (iv) අනෙකුත් .. | — | — 2 | — | — | — | — |
| 7. වැරදීම් හා අත්හැරීම් .. | + 29 | — 19 | + 31 | + 4 | — 8 | + 9 |

(1) ධන ලකුණින් වත්කම් අඩුවීම හෝ වගකීම් වැඩිවීම හෝ දක්වේ.

ගෙවුම් ශේෂ තත්ත්වයේ මේ සතුටු දායක තත්ත්වය උදාකර ගැනීමට පිළිවන් වූයේ, ඉහත සඳහන් කළ පරිදි, සාධක කීපයක් හේතුකොටගෙනය. ආනයන කපා හැරීමෙන්, වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි අසමතුලිතතාවය අඩුකර ගැනීමට දැඩි ප්‍රයත්නයක් දරන ලදී. වෙළෙඳ අනුපාතය සියයට 1 කින් දියුණුවීම මේ සඳහා තවත් රුකුලක් විය. 1964 දී රුපියල් කෝටි 196·0 ක්වූ මුළු අපනයන ගෙවීම, 1965 දී රුපියල් කෝටි 191·6 කට අඩු වුවද, අපනයන ඉපැයුම්, 1964 දී රුපියල් කෝටි 176·7ක් වූයේ, 1965 වනවිට එය රුපියල් කෝටි 191·1 ක් දක්වා

වැඩිවිය. රෙදිපිළි ඇතුළුව, පාරිභෝජන භාණ්ඩ ආනයන අඩුවිය. ප්‍රාග්ධන භාණ්ඩ ආනයන ද සැලකිය යුතු පමණකින් අඩු වුව ද අන්තර් භාණ්ඩ ආනයන ප්‍රමාණවත් නොවුන ද වැඩිවිය. ආනයන සංඛ්‍යාවල එකතුවෙන් ආනයන කපා හැරීම එක්වරම පෙනෙන්නේ නොවේ. අත්‍යාවශ්‍ය ආහාර වැඩියෙන් ගෙන්වීම නිසා (ආහාර කොමසාරිස්ට වෙන් කැරුන කොටස පමණක් රුපියල් කෝටි 10·2 කින් වැඩිවිය) අනෙක් භාණ්ඩ බොහෝ සෙයින් කපා හැරීමට සිදුවිය. වෙනත් ලෙසකින් කියන්නේ නම්, 1965 ලංකාව සතුටුදායක ගෙවුම් ශේෂ තත්ත්වයක් ලබා ගත්තේ සමාජයීය වශයෙන් සැහෙන පරිත්‍යාගයකින් පසුවය.

ගෙවුම් ශේෂ තත්ත්වය වැඩි දියුණු වීමෙහි ලා බලපැවැත් වූ දෙවැනි සාධකය වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් ගිවිසුම් සමහරක් නිසා රුපියල් කෝටි 5·34 ලංකාවේ විදේශීය සංචිත වලව ලැබීමය. මේ ගනුදෙනු ගෙවීමේ දී කෙටිකාලීන වශයෙන් අර්ථ ක්‍රමයට බරක් ඇති වන්නේය. ලංකාව විසින් වගකීම් අවුරුදු 3 සිට 5 දක්වා කාලයක් තුළ බේරුම් කිරීමට පිළියෙල කළ යුතුය. තවදුරටත් ආනයන කපා නොහැර මේ ඉටු කිරීමට නම්, නැවත මේ මුදල් ගෙවීමට ඇති ශක්තිය වහාම ඉතාමත් කෙටි කාලයක් තුළ දී වැඩිකර ගැනීම අත්‍යාවශ්‍යය.

විදේශාධාර වැඩි වැඩියෙන් ගලා ඊමෙන් ද, රටට විශේෂ අමතර වගකීම් වලට මුහුණ පෑමට සිදුවෙයි. මේ ආධාර සමහරක් දීර්ඝකාලීන වශයෙන් ලැබෙන අතර, අනෙක් ආධාර කෙටිකාලීන හා මැදිකාලීන වශයෙන් ලැබෙයි. දැනට මුහුණ පා තිබෙන විනිමය ප්‍රශ්නය විසඳීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හා වෙනත් ලෙසින් ගනු ලබන කෙටිකාලීන ණය, යම් දිනක ලඟ දී හෝ පසුව ගෙවීමට සිදුවන අතර, පොලියත්, ණයත් ගෙවීමේ දී අර්ථ ක්‍රමයට එය බරක් වනු නිසැකය. මේ වගකීම් ගෙවාලිය හැක්කේ ලැබෙන ආධාර හා ලංකාව තුළ ඇති සම්පත් මාර්ග අර්ථ ක්‍රමයේ නිෂ්පාදන හැකියාව ඉතාම කෙටි කාලයක් තුළ දී වර්ධනය කර ලන පරිදි ප්‍රයෝජනයට ගතහොත් පමණෙකි.

මෙය සංවර්ධන සැලැස්මක සම්පත් මාර්ග ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ බරපතල ප්‍රශ්නය මතු කරන්නේය. මීලඟ කොටසින් මේ ප්‍රශ්නය සම්බන්ධ කරුණු සමහරෙක් ගැන සාකච්ඡා වන්නේය.

### (4) ආර්ථික සංවර්ධන බලාපොරොත්තු - සම්පත් මාර්ග උපයෝගි කර ගැනීමේ ප්‍රශ්නය

1964 වාර්ෂික වාර්තාවෙන් ආනයන ශක්තිය පිළිබඳ ප්‍රශ්නයට අවධානය යොමු කරන ලදී. පසුගිය අවුරුදු කීපය තුළ අර්ථ ක්‍රමයේ ඇති වූ අත්දැකීම් වලින් මේ ප්‍රශ්නය වඩාත් පැහැදිලි වී ඇත. භාණ්ඩ ආනයනය කිරීමට ඇති හැකියාව පිළිබඳ ප්‍රශ්නය නිසා ආර්ථික වර්ධනය අඩාල වීමට හැකි අතර, තවත් සමහර බලවත් අවහිරකම් උද්ගත වියහැකි බව පෙනේ. විදේශාධාර වැඩි වැඩියෙන් ගලා ඒම හේතු කොට, වසර ගණනක්ම අර්ථ ක්‍රමයේ රුඳී තුබුන මෙකී ප්‍රශ්න මතුපිටට පැමිණ තිබේ. මේ ප්‍රශ්න පුළුල් වශයෙන් "සම්පත්-උපයෝගි කර ගැනීමේ" ශීර්ෂය යටතේ වර්ග කළ හැකිය.

වැඩි වැඩියෙන් ගලා එන විදේශාධාර වලින් හා දේශීය සම්පත් මාර්ග වලින් උසස් ම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා උපයෝගි කර ගැනීමේ දී ඇතිවන මූලික අවශ්‍යතාවය නම්, සුදුසු සැලැස්මක් සකසා ගැනීමය. මේ සඳහා දැනට තිබෙන ප්‍රාග්ධනය හා මිනිස් ශ්‍රමය කොතෙක් ද යන්න පැහැදිලි කරගත යුතු අතර, සංවර්ධනය උපරිම වේගයෙන් ඇතිකළ හැකි සංවර්ධන කලාප ද තෝරා ගත යුතුය. ජනගහනය ඉතාමත් වේගයෙන් වැඩිවෙමින් හා විදේශීය ණය ගොඩ ගැසෙමින් තිබෙන සමයක කාලය ඉතාමත් වැදගත් තැනක් ගන්නේය. අර්ථ ක්‍රමයේ තිබෙන මිනිස් ශ්‍රමය හා උපකරණ ද, ඉහළම ප්‍රතිඵල ලැබෙන සේ ඒවා යෙදිය හැකි අංශයන් කවරේ ද යන්න ද තෝරා බේරා ගැනීමේ අවශ්‍යතාවය ගැන තර්කයක් නොමැත. මෙය සමහරවිට මේ ප්‍රශ්නයේ වඩා ලෙහෙසි පැත්ත විය

හැකිය. මෙහි අමාරු ප්‍රශ්නය වනුයේ වහාම සංවර්ධනය කළ යුතුයැයි තෝරා ගෙන තිබෙන කලාපවල සුදුසු යෝජනා ක්‍රම කරා මේ සම්පත් මාර්ග වහ වහා යෙදවීමය. මේ සම්බන්ධයෙන් නොයෙකුත් අංශවල අවහිරකම් ඇතිවිය හැකිය. එහෙත්, සාකච්ඡා සඳහා මේ ප්‍රශ්න (අ) මිනිස් ශ්‍රමය පිළිබඳ ප්‍රශ්නය (ආ) සංස්ථාමය රාමුව පිළිබඳ ප්‍රශ්නය වශයෙන් වර්ග කළ හැකිය. ඉතිරි කොටසින් මෙය පුළුල් වශයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙයි.

## (අ) මිනිස් ශ්‍රමය පිළිබඳ ප්‍රශ්න

දැනට තිබෙන මිනිස් ශ්‍රමය කවරේ ද යන්න තෝරා බේරා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ඉහත සඳහන් කරන ලදී. දැනටමත් රටේ පුළුල්ව විහිදී ගිය රජයේ පරිපාලන යන්ත්‍රයක් සහ පරිපාලන හා ශිල්පි කටයුතු පුහුණුවත් එක්තරා ප්‍රමාණයකට ඇත. පුහුණු වූ අය සම්බන්ධයෙන් විශාල හිඟයක් පවත්නා බව මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සොයා බැලූ සමහර අයගේ අදහස විය. කම්කරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් මිනිස් ශ්‍රමය පිළිබඳව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් පවත්වන ලද සමීක්ෂණයකින් ඉංජිනේරු, ජෛවවේදීය, කෘෂිකාර්මික හා සමාජ විද්‍යා යන අංශවල වෘත්තීය හා ශිල්පීය පුහුණු වූවන් හිඟ බව නිගමනය කරන ලදී. ඊට මෑත 1963 දී ශිල්පීය අධ්‍යාපනය සම්බන්ධයෙන් පැවැත්වුනු කොමිසමට අනුව ශිල්පීය හා විද්‍යා අංග වලින් පමණක් නොව, කළමනාකාර සහ වාණිජ අංග වල ද පුහුණු වූවන් හිඟ බව එළිවිය. මේ හිඟය එක්තරා ශ්‍රේණියකට පමණක් සීමා වූවක් නොව, ශිල්පීන්, කාර්මිකයන් හා කර්මාන්ත කරුවන් යන සියළු ම ශ්‍රේණිවල පැතිරී ගිය අඩුවක් විය.

රජයේ හා පෞද්ගලික අංශයේ පරිපාලනය හා කළමනාකාරිත්වය පිළිබඳ පුහුණු වූවන් හිඟ බවට සාක්ෂි තිබේ. අය-වැය ලේඛනයෙන් බලාපොරොත්තු වූ ඉලක්කයට ප්‍රාග්ධන වියදම සකසා ගැනීමට පසුගිය කාලයේ කිසිම විටක රජයට නොහැකි විය. සමහර අවුරුදුවල කැරුන ප්‍රාග්ධන වියදම, වියදම් කිරීමට බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා සියයට 38 කින් පමණ අඩුවිය. පසුගිය වසරේ ද සම්මත වියදමෙන් වැය කොට ඇත්තේ සියයට 88 ක් පමණෙකි. මෑතක සිට, රජයේ හා අර්ධ රාජ්‍ය අංශයේ පරිපාලකයනට, පරිපාලක හා ව්‍යවසායක වගකීම් බොහෝ සෙයින් ඉසිලීමට සිදුව ඇත. නිසැකව ම, සමහරෙක් මෙය මනාව ඉටුකර ඇති අතර, සමහර රජයේ සමායතන, මෙහිලා අසමර්ථ වී ඇත. මෙයට එක් හේතුවක් නම්, කළමනාකාරිත්වයෙහි ඇති දුර්වලතාවන්ය. එම නිසා රාජ්‍ය අංශයේ සමහර සමායතන පාලනය සඳහා පුහුණු වූ සුදුසු පුද්ගලයන්ගේ අවශ්‍යතාවය පුන පුනා නොකිවමනාය.

කළමනාකාරිත්වය නිසා අසමත් ව ගිය තැන් ගැන පෞද්ගලික අංශයෙන් ලැබෙන සාක්ෂි අඩුය. නොයෙකුත් පාරිභෝගික භාණ්ඩ ආයතනයෙහි යෙදී සිටින වෙළෙඳුන්, කර්මාන්ත දිරිගැන්වීමේ අළුත් පිළිවෙත යටතේ මෑත දී නිෂ්පාදකයන් බවට පත් වී ඇත. මේ අය තමන්ගේ කුඩා කර්මාන්ත සාර්ථක අන්දමින් පාලනය කරගෙන යාමෙහිලා තරමක් දුරට සමත් වී ඇත. එහෙත් මේ අය, අයබදු හා තීරුබදු සහන ඇතිව, ආරක්ෂිත වෙළෙඳ පොලක වැඩි ඒකක ලාභමක් ලබමින් ක්‍රියා කරන බව පිළිගත යුතුය. මේ කර්මාන්ත වසර කීපයක් පවත්වාගෙන පැමිණිය ද, බදු සහන හා ආරක්ෂාව නොමැතිව, මේ කර්මාන්ත දිගට ම මුදල් අතින් ඔරොත්තු දී තිබේ ද යන්න සැක සහිතය. මේ සඳහා කළමනාකාර දක්ෂතාවන් අතින් හැර වෙනත් සාධක බොහෝ වෙයි.

ඉහළ පරිපාලන කටයුතු සඳහා පමණක් නොව, අනෙකුත් අංශ වල ද පුහුණු වූ පුද්ගලයන් හිඟ බවට ද සාක්ෂි ඇත. හැම අංශයක ම ශිල්පීන් හිඟ අතර, වර්ධනය වෙමින් පවත්නා අර්ථ ක්‍රමයක ඉදි කිරීමේ කර්මාන්තය සඳහා ශිල්පීන් අඩු බව සාමාන්‍යයෙන් දැක්ක හැකිය. ඉදි කිරීම සඳහා දැනට පවත්නා සීමාසහිත හැකියාව කෙරෙහි ඇති පීඩනය ද බලවත්ය. මෙය එක්තරා ප්‍රමාණයකට උපකරණ ඌනතාවය නිසා වියහැකි අතර, පුහුණු වූ අයගේ අඩුවක් ද ඇති

බව නිසැකය. සීමාසහිත ප්‍රමාණයක් සිටින මේසන්වරු සහ වඩුවන් ආදීන් ද ගෙවල් ඉදි කිරීමට හා ගෘහ භාණ්ඩ සෑදීමට සුදුසුවා මිස ඉංජිනේරු හා විශාල ගොඩනැගිලි ඉදි කිරීමෙහිලා සුදුසු වන්නේ නැත. ලංකාව මෙතෙක් අරඹා ඇති විශාල ඉදිකිරීම් කීපයේ වුව ද, වැඩ බොහෝ පමා වන බවත්, නිමා කොට ඇති ඒවායේ අඩු ලුහුඬුකම් ගහණ බවත් පෙනේ. මෙය එක්තරා ප්‍රමාණයකට ප්‍රමාණවත් පරිපාලනයක් නොමැති නිසාත්, දූෂණ කටයුතු නිසාත්, විය හැකි අතර, ශිල්පීන්ගේ අඩුව නිසැකයෙන් ම ප්‍රධාන සාධකය වී ඇත්තේ ය. එම නිසා මෙය සම්පත් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ ප්‍රශ්නයක්ව පවතින අතර, දැනට තිබෙන ප්‍රමාණයත්, අවශ්‍ය ප්‍රමාණයත් තක්සේරු කොට අසමතුලිත තාවය මගහැරවීමට පියවර ගත යුතුය.

## (ආ) සංස්ථාමය රාමුව

ප්‍රාග්ධන සම්පත් වැඩි වැඩියෙන් වෙන් කිරීමෙන් පමණක්, ඒ සුදුසු පරිදි ප්‍රයෝජනයට යෙදෙවෙන්නේ නොවේ. මේ සම්පත් රටේ යහපත සඳහා උචිත පරිදි යෙදවීමට හැඩ ගැසුන සංස්ථාමය රාමුවක් අවශ්‍යම ය. රාජ්‍ය අංශයේ නම්, සංවර්ධන යෝජනා ක්‍රම, සුපරීක්‍ෂාකාරීව සැලසුම් කොට, රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සමායතන මාර්ගයෙන් උචිත යෝජනා ක්‍රමසඳහා සම්පත් යෙදවිය යුතුය. මේ සංවර්ධන යෝජනා ක්‍රමවල ප්‍රගතිය ගැන නිතර ම පරීක්‍ෂාකාරී වීම අත්‍යාවශ්‍යය. මෙසේ ප්‍රගති පාලනය පවත්වාගෙන යාම පමණක් නොව වරායේ වහ වහා බඩු ගොඩබෑමත් ප්‍රමාණවත් ගබඩා පහසුකම් සැලසීමත්, ආනයනය කළ බඩු කඩිනමින් යෝජනා ක්‍රම වෙතට ලඟා කරවීමත් වැදගත් ය මේ ප්‍රශ්න මෙහි දී මතක් කෑරුනේ විශේෂයෙන් විදේශාධාර ක්‍රම වලින් වැඩි වැඩියෙන් ලැබෙන උපකරණ පරිහරණය සඳහා රටේ සංස්ථාමය රාමුව, නැවත සකසා ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කිරීමේ අටියෙනි. බැංකු ක්‍රමය ගැන ද වචනයක් කිව යුතුය. ආධාර වැඩ පිළිවෙල වල අදහස විය යුත්තේ පෙර දී ඇති වූවාට වැඩි ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීමය. මෙහිලා දේශීය වශයෙන් කෙටිකාලීන හා දිගුකාලීනව ලබා ගතහැකි මුදල් ප්‍රමාණය වැඩි කළ යුතුය. ලංකාවේ වෙළෙඳ බැංකු ක්‍රමය සංවර්ධනය සඳහා මුදල් යෙදවීමට සැකසුන ක්‍රමයක් නොවේ. එය සැකසී ඇත්තේ විරාගත වශයෙන් වූ ආනයන-අපනයන අර්ථ ක්‍රමයක අවශ්‍යතා සඳහා ය. එසේ වුව ද, සංවර්ධනය සඳහා මුදල් යෙදවීමට එය සකසා ගැනීමේ එක්තරා හැකියාවක් ද නොමැත්තේ නොවේ.

රජයේ අනුග්‍රහය ඇතිව පිහිටුවා තිබෙන දිගුකාලීන වශයෙන් ණය දෙන ආයතන වලට වර්ධනය වෙමින් පවත්නා අර්ථ ක්‍රමයක එවැනි ආයතනවලින් බලාපොරොත්තු වන පමණට සේවාවක් කිරීමට මෙතෙක් පිළිවන් වී නොමැතිය. මෙය සමහරවිට, නීතිමය බලතල ප්‍රමාණවත් නොවීම, අත්දැකීම් මඳවීම හා පෞද්ගලික අංශයේ අරඹන යෝජනා ක්‍රම අඩුවීම නිසා වූවා විය හැකිය. මේ ප්‍රශ්න ලංකාවට පමණක් විශේෂ වූයේ නොවේ. මෙකී ප්‍රශ්න සංවර්ධනය වෙමින් පවත්නා හැම රටක ම දක්නට ලැබේ. මෙහිලා නියම ප්‍රශ්නය වී ඇති බව පෙනෙන්නේ ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා අර්ථ ක්‍රමයක සංවර්ධන මූල්‍යායතන වලින් ඉටු විය යුතු සේවාව සම්බන්ධයෙන් ඇති වැරදි වැටහීමය. සංවර්ධන බැංකුවක්, මුදල් යෙදවීමට සුදුසු යෝජනා ක්‍රම සකසාගෙන ව්‍යවසායකයා එනතෙක් බලා සිටිය යුතු නැත. අනෙක් අතට මුදල් යෙදවිය හැකි යෝජනා ක්‍රම ක්‍රියාවට නැඟිය හැකියැයි සිතන ව්‍යවසායකයන්ට බැංකුවේ සහාය ද ඇතිව, යාමට භාර දිය යුතුය. අවශ්‍යයෙන් ම කළයුතු වුව ද, උකස් සඳහා ණය දීම සංවර්ධන ණය දීමක් නොවේ. දෙවැනිව කී කරුණ සඳහා දෙන ණය, දැනට තිබෙන ඇපයක් නිසා දෙන ණයක් නොව, ණයට ගන්නා, ගනු ලබන ණය මුදලින් ම ඇති කිරීමට බලාපොරොත්තු වන ඇපයක් සඳහා දෙන ණයයි. මෙවැනි සංවර්ධන බැංකු කටයුතු සඳහා යෝජනා ක්‍රම අගැයීම සඳහා අවශ්‍යවන ශූරීන්

දැනට ලංකාවේ ඇති සංවර්ධන මූල්‍යායතන වල ඇත්තේ ම නැත. එසේ ම ආයෝජන ක්‍රම මනාව පරීක්‍ෂා කිරීමත්, ණය දෙන ආයතනයන් හෝ වෙනත් අනුබද්ධ ආයතනයකින් නිතර ම ණය ගන්නාට උපදෙස් දීම හා මග පෙන්වීමත් අත්‍යාවශ්‍ය වන්නේ ය.

මේ ප්‍රශ්න ගැන මහ බැංකුව විශේෂයෙන් සලකා බලාගෙන යන්නේ ය. සථායීකරණය සඳහා හා ක්‍රියාවට නැඟිය හැකි සැලැස්මක අවශ්‍යතාවය දැනට පිළිගෙන ඇති නිසාත්, සෑහෙන ප්‍රමාණයකට විදේශාධාර ලැබිය හැකි නිසාත්, රටේ සංවර්ධන කටයුතු සඳහා උචිත වන පරිදි බැංකුක්‍රමයේ හා සංවර්ධනයට මුදල් යෙදවීමේ ක්‍රමයේ, සමහර වෙනස්කම් ඇති කිරීම ඇරඹීමට මහ බැංකුව බලාපොරොත්තු වෙයි.

## (5) නිගමනය

1965 දී ප්‍රමාණවත් ආර්ථික වර්ධනයක් ඇති වී නොමැත. මූල්‍ය ප්‍රාසාරණය සාධාරණ මට්ටමක තබා ගත හැකි වුවද, මුළු ඉල්ලීමේ පමණට භාණ්ඩ සැපැයුම මඳවිය. මෙයට එක් අතෙකින්, පිටරටින් භාණ්ඩ ගෙන්වා ගැනීමට තරම් විදේශීය විනිමය ප්‍රමාණවත් නොවීමත්, අනෙක් අතට, දේශීය නිෂ්පාදන සෑහෙන පමණට ඇති නොවීමත් හේතු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මිල මට්ටම, වැඩිවෙමින් තිබිණි. අර්ථ ක්‍රමයේ ආනයන ශක්තිය වැඩි කර ගැනීම සඳහා ආර්ථික කටයුතු හා නිපැයුම වැඩි කර ලීමේ අටියෙන් මෙරට හා පිටරට ශේෂ වැඩි කර ගැනීම් සඳහා ද වර්ෂය තුළ පියවර ගන්නා ලදී.

මේ අනුව උපකරණ හා මිනිස් ශ්‍රමය වශයෙන් ඇති රටේ සම්පත් මාර්ග වලින් හැකි උසස් ම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ශ්‍රමය හා සංසථා රාමුව වහාම වැඩට යෙදවීමේ බලවත් අවශ්‍යතාවය කෙරෙහි මෙකී ප්‍රතිපත්ති වලින් අවධානය යොමු කරන්නේ ය.